# සහනාධාර හා ස්වයං රැකියා

කිසියම් සමාජයක, බහුතර පිරිස විසින්, ''සමාජ ප්‍රශ්ණයක්'' සේ සලකනු ලබන සිදුවීම හෝ ක්‍රියාව එම සමාජයේ ''සමාජ ප්‍රශ්ණයක්'' වශයෙන් සැලකිය හැකිය. මේ අනුව බලන විට අප විසින් විසඳා ගතයුතුව ඇති සමාජ ප්‍රශ්ණ සංඛ්‍යාව තරමක් විශාලය. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු, අපට විසඳා ගැනීමට තිබුණ මූලික ගැටළු අතරට එක්වූ, නිවාස ප්‍රශ්ණය, රැකියා ප්‍රශ්ණය, සෞඛ්‍ය ප්‍රශ්නය වැනි පොදු සමාජ ප්‍රශ්ණ මෙහිදී ප්‍රධාන ස්ථානයක ලා සැලකිය හැකිය. අප එතෙක්, මෙතෙක් විවිධ උපාය මාර්ග උපයෝගී කර ගනිමින්, විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරමින් මෙවන් ප්‍රශ්ණ සඳහා විසඳුම් සොයනු ලැබීය.

විවිධ මාදිලියේ සහනාධාර ක්‍රම මගින් මිනිසාට සිය දෛනික ජීවිතයේදී, සමාජීය හා දේශපාලන ගැටළු වලට මුහුණ පෑමට සිදුවන බව අමතක විය. එසේම සිය සංවර්ධන කාර්ය කුමක් ද යන්න තේරුම් ගත නොහැකි විය. එම නිසා ඔහු අකර්මණ්‍ය සහනාධාර යේ වහලෙකු බවට පත්ව් තිබුණි. මෙම තත්ත්වය අවබෝධ කර ගැනීමත් සමඟ, එතෙක් අපගේ සමාජ ප්‍රශ්ණ විසඳීමට සැකසුන වැඩ සටහන්ද නව මුහුණු වරකට එළඹුණි.

කෙසේ වෙතත් සහනාධාර හා පිහිටා ධාර නිසා රජයට පහත සඳහන් ගැටලු වලට මුහුණ දීමට සිදුවිය.

1. විශාල මුදල් ප්‍රමාණයක් වාර්ෂිකව සහනාධාර හෝ පිහිටාධාර වෙනු වෙන් වැය කිරීමට සිදුවීම,
2. සහනාධාරයේ ස්වරූපය අනුව 'නිෂ්පාදනයේ' සහ මිලෙහි සිදුවන නිරන්තර වෙනස්වීම,
3. සුවිශේෂ අවස්ථාවන්හිදී දෙනු ලබන සහනාධාර කාලයක් ගතවන විට අනිවාර්යෙන්ම දිය යුතු අංගයක් බවට පත්වීම,
4. සහනාධාර දීම හා සම්බන්ධිත කළමණාකරණය විවේචනයන්ට ලක්වීම.

අසූව දශකයේ අග භාගයේ සැකසුන නව සහනාධාර ක්‍රම, හා විවිධ වූ වැඩ සටහන් තුල, ප්‍රතිලාභ ලබන්නා මඟින් ද ඉටු කල යුතු කාර්ය භාරයක් විය. මෙහි ප්‍රධාන අභිලාෂය වූයේ නිෂ්පාදන ක්‍රියාදාමයට යොමු නොවූ පිරිස ඊට එක්කර ගැනීමයි. මේ වන විට දිගු කාලයක් තුල ප්‍රමාණවත් අවධානයකට ලක්වී නොතිබුන ස්වයං රැකියා සහ ස්වයං රැකියා ව්‍යාපෘති කෙරෙහි රාජ්‍ය අංශයේ දැඩි අවධානය ද යොමු විය. ඒ සමගම රජය සතු මූල්‍යායතන සහ වෙනත් ආයතනද ස්වයං රැකියා සංවර්ධනය කිරීම පිණිස තම අවධානය යොමු කරන ලදී.

## දිවුලපිටියේ
## යූ. ඊ. සේනානායක විසිනි.

තවමත් මෙරටෙහි මුළු ජනගහන යෙන් 70% කට ආසන්න ප්‍රමාණයක් ග්‍රාමීය අංශයෙහි ජීවත් වේ. දුෂ්කර සහ කටුක දිවි පෙවෙතක් ගෙවන මෙම ගැමි ප්‍රජාව ඉහත සඳහන් කළ ගැටලු වලින් මිරිකෙමින් පසුවුවද ලැබෙන යම් පහසුකමක් වේ නම් එයින් කිසියම් ඵලදායී කාය්‍යයක් ඉටු කිරීම අභිලාෂ යෙන් පසුවේ. නමුත් ඒ සඳහා ප්‍රමාණ වත් වූ අවබෝධයක් ඔවුන් සතුව පවතීද? ඒ අවබෝධය අප විසින් ලබා දුන්නේ ද යන්න සැලකිල්ලට ලක්කල යුතු කරුණකි.

ස්වයං රැකියාව යනු ''ස්ව ශක්තිය'' මත විශ්වාසය තබා ගොඩ නඟා ගන්නා ජීවන වෘත්තියකි. මෙමගින් සිදුවන නිෂ්පාදන කාර්යය බොහෝ විට යැපුම් මට්ටමකට පමණක් සීමා වේ. ස්වයං රැකියා ව්‍යාපෘති ඉහත සඳහන් ස්වයං රැකියාවන්ට වඩා වෙනස් වූවකි. රජය පිළිගත් මූල්‍යායතන ණය පහසුකම් වැඩි වශයෙන්ම ලබා දෙන්නේ මෙම ස්වයං රැකියා ව්‍යාපෘති සඳහාය. කෙසේ වුවද ඕනෑම ස්වයං රැකියාවක් සම්බන්ධව යම් පහසුකමක් හෝ උපදේශයක් ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය සම්බන්ධ වාර්තාවක් සැපයිය යුතුව ඇත. මූල්‍යායතන ප්‍රධාන වශයෙන් මෙම ව්‍යාපෘති වාර්තා සලකා බලන අතර ශක්‍යතාවය ඉහළ නම්, අමතර විමසීම් වලින් අනතුරුව මූල්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කරයි. මෙම ව්‍යාපෘති වාර්තාව, දැනුම්–තේරුම් ඇති අයෙකු ලවා සකසා ගත හැකි වුවද ව්‍යාපෘතිය ඇරඹීමට ඒ හා සම්බන්ධ හැකියාවක්, දක්ෂතාවක් මෙන්ම දැනුමක් ද අත්‍යවශ්‍යය.

මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ අපහසුව නිසා සිදු වන්නේ, ශක්‍යතාවයෙන් වැඩි ව්‍යාපෘතියක් සඳහා මූල්‍ය පහසුකම් විමසුවද, ඔවුනට කල හැකි , දැනුමේ, දක්ෂතාවයේ සහ හැකියාවේ පමණට ගැලපෙන වෙනත් ස්වයං රැකියාවක නියුක්ත වීමයි. මේ නිසා ස්වයං රැකියාව අසාර්ථක වෑයමක් බවට පත්වීම බොහෝ විට සිදුවේ. එවිට අවසාන වැරදි කරුවා වශයෙන් චෝදනා ලබන්නේද ස්වයං රැකියාවන්හි නිරත වූවන්මය.

මේ නිසා නිසි අවබෝධයකින් තොරව කරන්නන් වාලේ යන ස්වයං රැකියා කරුවා ඒ ගැන අවබෝධයක් ලබන්නේ ණය ගැතියකු බවට පත්වීමෙන් අනතුරුවය. එනිසා ස්වයං රැකියා කිරීමට අපේක්ෂා කරන්නන් ඒ ගැන නිසි අවබෝධයක් ලබාගත යුතුවේ. එසේම එම අවබෝධය ලබාදීම ස්වයං රැකියා සඳහා පොළඹ වන්නන්ගේද යුතුකමකි.

## 23 වෙනි පිටෙහි සඳහන් ජන ගී තේරවිලිවල පිළිතුරු

1. කුරක්කන් පිට්ටුව
2. මිරිස්ගල සහ ඇඹරුම්ගල
3. කෙසෙල් ගස
4. තිස්සමහාරාමය
5. පුවක් ගස
6. මී පැණි